# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

පසුගිය දිනවල ජනමාධ්‍ය මගින් ප්‍රචාරය වූ ඉතාමත් සංවේදී මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම සම්බන්ධයෙන් නිශේධනාත්මක ආකාරයෙන් මාධ්‍ය ප්‍රචාරයන් සිදුවූ ආකාරයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ.

2017 ඔක්තෝබර් මස 30 වන දින අනුරාධපුර ප්‍රදේශයේ පාසල් දැරියක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කොළඹ ප්‍රධාන කාර්යාලයේ දී පවත්වන ලද පරීක්ෂණය සම්බන්ධයෙන් ජනතාව නොමග යවන සුළු හා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණීම අධෛර්යමත් කරන ප්‍රවෘත්ති විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පළ විය. එම සංවේදී පැමිණිලි විභාගයේ දී වින්දිත පාර්ශවය වෙත අගතියක් නොවන ආකාරයෙන් ප්‍රධාන කාර්යාලයට කැඳවීම හා පැමිණිලි විභාගයෙන් අනතුරුව පිටත්කර හැරීම සිදුකරන ලදී. ඒ පිළිබඳ කොමිෂන් සභාවෙන් නිසි තොරතුරු විමසීමකින් තොරව ව්‍යාජ ප්‍රවෘත්ති පළ වූ ආකාරයක් නිරීක්ෂණය වේ.

එමෙන්ම පරීක්ෂණය පැවැත්වූ දින යම් සන්ධ්‍යා ප්‍රවෘත්ති ප්‍රකාශන මගින් අසත්‍ය ලෙස එම පරීක්ෂණයට අදාළ දැරිය හා දෙමාපියන් නොපැමිණි බව ප්‍රචාරණය කරන ලදී.

රට තුළ මානව හිමිකම් ගරු කරන සංස්කෘතියක් ඇති කිරීම සඳහා ජනමාධ්‍ය වෙත විශාල වගකීමක් පැවරී ඇති අතර, එය වඩාත් වගකීමෙන් ඉටුකිරීම මගින් ජනතාවට තම අයිතීන් ආරක්ෂා කර ගැනීමට දිරිමත් වන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීමටත්, රටේ ශක්තිමත් මානව හිමිකම් සංස්කෘතියක් බිහිකිරීමට එය පාදක වනු ඇත.

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka